ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2018 ජූලි මස 06 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය: 2018 - අංක 04

**ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේ පවත්වා ගනී**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, 2018 ජූලි මස 05 වැනි දින පැවති රැස්වීමේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේ පවත්වා ගැනීමට තීරණය කළේය. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 7.25 සහ සියයට 8.50 මට්ටමේ පවතී. මුදල් මණ්ඩලයේ මෙම තීරණය මගින් මැදිකාලීනව උද්ධමනය මැදි තනි අගයක මට්ටමේ ස්ථාවර කිරීම සහ එමගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ හිතකර වර්ධනය සඳහා දායක වීමට අරමුණු කෙරේ.**

**සැපයුම් අංශයේ තාවකාලික පීඩන හමුවේ වුවද උද්ධමනය මැදි තනි අගයක මට්ටමේ ස්ථාවරව පැවතිණි.**

දේශීය ඛනිජ තෙල් නිෂ්පාදන මිල ගණන් සහ අනෙකුත් පරිපාලිත මිල ගණන් ඉහළ නැංවීමේ ප්‍රතිඵලයක් ලෙස සිදු වූ තාවකාලික ඉහළ යෑම් හමුවේ වුවද කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය

(ජා.පා.මි.ද.) අනුව මනිනු ලබන මතුපිට උද්ධමනය අඩු තනි අගයක මට්ටමේ පැවතුණි. මූලික උද්ධමනය ද අඩු මට්ටමක පැවති අතර, උද්ධමන අපේක්ෂා හිතකර මට්ටමක පැවතුණි. අඩු ඵලදා කාලයේදී දේශීය ආහාර සැපයුම මත ඇති වන පීඩන මගින් යම් මිල ඉහළ යෑමක් කෙටිකාලීනව සිදු වුවද, ස්ථාවර උද්ධමන අපේක්ෂා සහ සුදුසු ප්‍රතිපත්තිමය වෙනස්කම් මගින් වසරේ ඉතිරි කාලය තුළදී සහ මැදිකාලීනව උද්ධමනය අපේක්ෂිත මැදි තනි අගයක මට්ටමේ පවතිනු ඇතැයි අපේක්ෂිතය.

**2018 වසරේ පළමු කාර්තුව තුළදී ආර්ථික වර්ධනය අඩු මට්ටමක පැවතුණි.**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත තාවකාලික ඇස්තමේන්තු අනුව, 2017 වසර සඳහා වූ සියයට 3.3 ක සංශෝධිත වාර්ෂික වර්ධනය හා සැසඳීමේදී ශ්‍රී ලංකා ආර්ථිකය 2018 වසරේ පළමු කාර්තුව තුළදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.2 කින් වර්ධනය විය. 2018 වසරේ පළමු කාර්තුව තුළ ආර්ථික වර්ධනය සඳහා සේවා සහ කෘෂිකාර්මික ආශ්‍රිත කටයුතු ප්‍රධාන වශයෙන් දායක වූ අතර, කර්මාන්ත ආශ්‍රිත කටයුතුවල මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා විය. ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා වන රජයේ අඛණ්ඩ කැපවීම මගින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය සිදුවන අතරම, මැදිකාලීනව ආර්ථිකයට සිය විභව මට්ටම කරා ළඟා වීමට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය ආර්ථිකය තිරසාරව යථා තත්ත්වයට පත්වීම මගින් දේශීය ආර්ථික වර්ධනය සඳහා සහාය වනු ඇතැයි අපේක්ෂිත අතර, පවතින අඩු උද්ධමන වාතාවරණය සහ යෝග්‍ය ලෙස අගය කළ නම්‍යශීලී විනිමය අනුපාතිකයක් මගින් ද ඉහළ වර්ධනයට පහසුකම් සපයනු ඇතැයි අපේක්ෂිතය.

**නාමික සහ මූර්ත පොලී අනුපාතික අඛණ්ඩව ඉහළ අගයක පැවති අතර, මුදල් සැපයුමේ වර්ධනය මන්දගාමී විය.**

දේශීය මුදල් වෙළඳපොළෙහි පවතින හිඟ ද්‍රවශීලතා තත්ත්වවලට ප්‍රතිචාර දක්වමින් කෙටිකාලීන පොලී අනුපාතික මෑතකදී ඉහළ ගියේය. කෙටිකාලීන රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික මෑත කාලීනව මිශ්‍ර හැසිරීමක් පෙන්නුම් කළ අතර, අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ මට්ටම්වල ස්ථායීව පැවතුණි. සුදුසු විවට වෙළඳපොළ මෙහෙයුම් කටයුතු තුළින් කෙටිකාලීන ද්‍රවශීලතා තත්ත්වයට පිළියම් යොදන අතරම, ශ්‍රී ලංකා මහ බැංකුවේ මධ්‍යස්ථ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට සහ

පවත්නා පහළ උද්ධමන වාතාවරණයට අනුරූපීව නාමික හා මූර්ත පොලී අනුපාතික ක්‍රමයෙන් පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මේ අතර, 2018 මැයි මාසයේදී පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය මන්දගාමී විය. 2018 මාර්තු මාසයේදී දක්නට ලද උත්සව සමය හේතුවෙන් සිදු වූ ණය ප්‍රසාරණයෙන් පසුව 2018 අප්‍රේල් සහ මැයි මාසවලදී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය වර්ධනය ද මන්දගාමී විය.

**විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය සඳහා ඉහළ ගිය විදේශ විනිමය සංචිත තත්ත්වය හේතු විය.**

අපනයන ආදායම් අඩු වීම සහ ඉහළ ගිය ආනයන වියදම්හි ප්‍රතිඵලයක් ලෙස 2018 වසරේ පළමු මාස හතර තුළදී වෙළඳ හිඟය පුළුල් විය. මෑත කාලීන ආනයන ඉහළ යෑම සඳහා පෞද්ගලික වාහන සහ රත්‍රන් ආනයන වැඩි වශයෙන් හේතු වූ අතර, රත්‍රන් ආනයන මත පනවන ලද තීරු බදු හේතුවෙන් එම ආනයන අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2018 වසරේ මේ දක්වා කාලය තුළදී සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ධනාත්මක වර්ධනයක් අඛණ්ඩව සිදු විය. දැඩි ගෝලීය මූල්‍ය තත්ත්වවල බලපෑම හමුවේ 2018 වසරේ මේ දක්වා කාලය තුළදී රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙන් සහ කොළඹ කොටස් වෙළඳපොළෙහි ද්විතීයික වෙළඳපොළෙන් මූල්‍ය ගලා යෑම් සිදු වූ නමුදු කොළඹ කොටස් වෙළඳපොළෙහි ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ මූල්‍ය ලැබීම් හේතුවෙන් කොළඹ කොටස් වෙළඳපොළ වෙත වසරේ මේ දක්වා කාලය තුළදී සමස්ත ශුද්ධ ලැබීම් වාර්තා විය. මෙම වර්ධනයන් මධ්‍යයේ 2018 වසරේ පළමු භාගය වන විට ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය වෙළඳපොළ වෙතින් ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 141 ක විදේශ විනිමය මිලදී ගෙන ඇත. 2018 වසරේ අප්‍රේල් මාසයේදී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය සාර්ථකව නිකුත් කිරීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම යටතේ පස් වන වාරිකය හිමිවීම, හම්බන්තොට වරාය ආයෝජකයන් වෙත පැවරීමෙන් ලද ලැබීම් සහ 2018 වසරේ මුල් කාලයේදී මහ බැංකුව දේශීය වෙළඳපොළ වෙතින් විදේශ විනිමය මිලදී ගැනීම හේතුවෙන් දළ නිල සංචිත ප්‍රමාණය 2017 වසර අවසානය වන විට වාර්තා කරන ලද එ.ජ ඩොලර් බිලියන 8.0 හා සැසඳීමේදී 2018 ජුනි මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 9.2 ක් දක්වා වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු ගත කොට ඇත. 2018 වසරේ මේ දක්වා කාලය තුළදී එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 3.6 කින්

අවප්‍රමාණය වී ඇත. එ.ජ. ඩොලරය ජාත්‍යන්තර වෙළඳපොළ තුළ පුළුල් ලෙස ශක්තිමත් වීම පිළිබිඹු කරමින් අප්‍රේල් මස අග භාගයේ සිට මෙම අවප්‍රමාණය වැඩි වශයෙන් සිදු විණි. විදේශ විනිමය වෙළඳපොළෙහි අනිසි වාසි ලබාගැනීමේ අරමුණෙන් කටයුතු කිරීම පාලනය කිරීම සහ විනිමය අනුපාතිකයෙහි ඉහළ උච්චාවචන මැඩපැවැත්වීම සඳහා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් විය.

**උද්ධමනය මැදි තනි අගයක මට්ටමේ ස්ථාවර කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය නොවෙනස්ව පවත්වා ගනී.**

මෑතකාලීන වර්ධනයන් සහ ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යවල පුරෝකථන මත පදනම්ව, දැනට පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වා ගැනීම යෝග්‍ය බව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස විය. ගෝලීය වෙළඳපොළ වර්ධනයන් සහ එමගින් ඇති විය හැකි බලපෑම් පිළිබඳ මහ බැංකුව අවධානය යොමු කරන අතර, දේශීය මූර්ත ආර්ථික කටයුතු සමීපව අධ්‍යයනය කිරීම අඛණ්ඩව සිදු කරනු ලබයි.

ඒ අනුව, මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) දැනට පවතින මට්ටමේ පවත්වා ගැනීමට මුදල් මණ්ඩලය තීරණය කළේය.

| **මුදල් ප්‍රතිපත්ති තීරණය:** | **ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවතී** |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | සියයට 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | සියයට 8.50 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 7.50 |

**තොරතුරු සටහන:**

මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතාගේ ප්‍රධානත්වයෙන් අද දින (2018 ජූලි 06) මධ්‍යහ්න 12.00 ට ශ්‍රී ලංකා මහ බැංකුවේ ජෝන් එක්ස්ටර් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී මාධ්‍ය හමුවක් පැවැත්වේ.

මීළඟ මුදල් ප්‍රතිපත්ති නිවේදනය 2018 අගෝස්තු මස 03 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

දත්ත ඇමුණුම:

## සංඛ්‍යා සටහන 01: මූර්ත ද.දේ.නි.යේ වර්ධනය (තාවකාලික)

| ආර්ථික කටයුතු | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 | | | | | 2018 |
| | වාර්ෂික | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | පළමු කාර්තුව |
| කෘෂිකාර්මික | **-3.8** | -4.4 | -3.1 | -3.0 | 7.1 | **-0.8** | 4.8 |
| කර්මාන්ත | **5.8** | 3.7 | 5.6 | 5.3 | 4.1 | **4.6** | 0.9 |
| සේවා | **4.7** | 4.3 | 2.7 | 2.8 | 3.2 | **3.2** | 4.4 |
| ද.දේ.නි. | **4.5** | **3.4** | **3.0** | **3.2** | **3.5** | **3.3** | **3.2** |

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## සංඛ්‍යා සටහන 02: උද්ධමනය

| මාසය | | දෙසැ-17 | ජන-18 | පෙබ-18 | මාර්-18 | අප්‍රේ-18 | මැයි-18 | ජුනි-18 |
|---|---|---|---|---|---|---|---|---|
| මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස) | කො.පා.මි.ද. (2013=100) | 7.1 | 5.8 | 4.5 | 4.2 | 3.8 | 4.0 | 4.4 |
| | ජා.පා.මි.ද. (2013=100) | 7.3 | 5.4 | 3.2 | 2.8 | 1.6 | 2.1 | - |
| මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස) | කො.පා.මි.ද. (2013=100) | 4.3 | 3.5 | 3.5 | 3.4 | 3.5 | 3.2 | 3.4 |
| | ජා.පා.මි.ද. (2013=100) | 2.7 | 2.1 | 2.0 | 1.9 | 1.9 | 1.7 | - |

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## සංඛ්‍යා සටහන 03: මුදල් අංශයේ ප්‍රවණතා (තාවකාලික)

| දර්ශකය | ප්‍රමාණය (රුපියල් බිලියන) | | | | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජන-18 | පෙබ-18 | මාර්-18 | අප්‍රේ-18 | මැයි-18 | ජන-18 | පෙබ-18 | මාර්-18 | අප්‍රේ-18 | මැයි-18 |
| සංචිත මුදල් | 930 | 938 | 997 | 1,000 | 973 | 12.3 | 10.7 | 11.8 | 12.9 | 13.2 |
| පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 6,378 | 6,451 | 6,607 | 6,692 | 6,671 | 16.8 | 16.2 | 16.4 | 16.8 | 15.0 |
| ශුද්ධ විදේශීය වත්කම් | 128 | 116 | 106 | 119 | 74 | 138.9 | 131.3 | 128.6 | 135.0 | 123.4 |
| ශුද්ධ දේශීය වත්කම් | 6,251 | 6,335 | 6,500 | 6,572 | 6,597 | 8.0 | 7.0 | 7.5 | 8.2 | 7.8 |
| රජය වෙත ලබා දුන් ශුද්ධ ණය | 2,221 | 2,246 | 2,278 | 2,322 | 2,324 | 5.1 | 2.4 | 2.9 | 5.3 | 3.8 |
| රාජ්‍ය ව්‍යවසායන් සඳහා ලබා දුන් ණය (අ) | 528 | 546 | 557 | 581 | 608 | -1.5 | -1.4 | -2.6 | 0.8 | 4.8 |
| පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය (අ) | 4,842 | 4,900 | 5,022 | 5,044 | 5,073 | 15.2 | 14.6 | 15.3 | 15.3 | 15.1 |
| පුළුල් මුදල් සැපයුම ($M_4$) | 7,900 | 7,979 | 8,112 | 8,218 | 8,207 | 17.7 | 17.1 | 16.7 | 16.8 | 15.1 |

(අ) සංශෝධිත

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

## සංඛ්‍යා සටහන 04: පොලී අනුපාතික

| පොලී අනුපාතික (%) | 2017 දෙසැ. අවසානයට | 2018 මාර්. අවසානයට | 2018 අප්‍රේ. අවසානයට | 2018 මැයි අවසානයට | 2018 ජුනි අවසානයට | 2018 ජූලි 05 දිනට |
|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 7.25 | 7.25 | 7.25 | 7.25 | 7.25 | 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 8.75 | 8.75 | 8.50 | 8.50 | 8.50 | 8.50 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)** | 8.15 | 8.41 | 7.86 | 7.93 | 8.50 | 8.48 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | | | | |
| දින 91 | 7.69 | 8.17 | 8.10 | 8.34 | 8.32 | 8.35 |
| දින 182 | 8.30 | - | - | 8.93 | 8.85 | 8.85 |
| දින 364 | 8.90 | 9.69 | 9.59 | 9.62 | 9.39 | 9.43 |
| **ණය අනුපාතික** | | | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) (සතිපතා) | 11.55 | 11.55 | 11.21 | 11.42 | 11.33 | - |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) | 13.88 | 14.04 | 14.13 | 14.06 | - | - |
| බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR) | 14.31 | 14.25 | 14.29 | 14.15 | - | - |
| **තැන්පතු අනුපාතික** | | | | | | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 9.07 | 9.00 | 8.98 | 8.91 | 8.92 | - |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 11.48 | 11.41 | 11.38 | 11.23 | 11.26 | - |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 10.06 | 10.33 | 10.75 | 10.67 | - | - |

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*